# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1987/37 - 2016 ඔක්තෝබර් මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2016.10.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### පඩිපාලක සහා ආඥාපනත

### නාවික ප්‍රවාහන හා මෙහෙයුම් සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව

**7 වන වගන්තිය යටතේ නිවේදනයයි**

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය ඩබ්. ඩී. ජේ. සෙනෙවිරත්න වන මම (136 වන අධිකාරය) පඩිපාලක සභා ආඥා පනතේ 6(1) වගන්තිය යටතේ නාවික ප්‍රවාහන හා මෙහෙයුම් සේවා කර්මාන්තය පිළිබඳව ආඥාවක් පැනවීමට අදහස් කරන බව පඩිපාලක සභා ආඥා පනතේ 7 (1) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරමි.

මෙම යෝජිත ආඥාවට යම් විරෝධතාවයක් ඇතොත් 2016 ඔක්තෝබර් මස 24 දින දහවල් 12.00 දක්වා ම විසින් භාරගනු ලැබේ.

එසේ එවනු ලබන සෑම විරෝධතාවයක්ම ලිඛිතව ඉදිරිපත් කළ යුතු අතර ඒ විරෝධතාවයන්ට හේතු වූ කරුණු පිළිබඳව ප්‍රකාශයන්ද එහි ඇතුළත් විය යුතු යි.

ඩබ්. ඩී. ජේ. සෙනෙවිරත්න,
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2016 ඔක්තෝබර් මස 04 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*ආඥාව*

1941 අංක 27 දරන පඩිපාලක සභා ආඥා පනතේ II කොටසේ විධිවිධානයන් මෙහි පහත දැක්වෙන කර්මාන්තයට අදාළ වන්නේ ය. එනම් නාවික ප්‍රවාහණය හා මෙහෙයුම් සේවා කර්මාන්තය.

නෞකා තටාක, තොටුපල සහ වරාය පරිශ්‍රයන් ඇතුළත හා ඉන් පිටත සිදු කෙරෙන නාවික ප්‍රවාහනය, මෙහෙයුම් සේවා හා ඊට අනුබද්ධිත වෙනත් ප්‍රවාහණ හා මෙහෙයුම් සේවා වලට ආදාළව සේවයේ නිරත පහත සඳහන් සේවා කාණ්ඩ හා ඊට අනුෂාංගික කාර්යයන් හි නිරත සේවකයින් නාවික ප්‍රවාහන හා මෙහෙයුම් සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යටතට ගැනෙන්නේ ය.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*නුපුහුණු*

1. කාර්ය සහායක
2. නැව් කම්කරු (දියත්)
3. නැව් සේරදන්වරු
4. පයිප්ප සේරදන්වරු (දියේ)
5. ග්‍රීස් ගසන්නා
6. බඩු අසුරන්නා
7. සීනුව නාද කරන්නා/සංඥාකරු/ලෑෂිංකරු
8. සහායක බාරගැනීමේ/බෙදා හැරීමේ නිලධාරී
9. බඩු ඔසවන්නා

*අර්ධ පුහුණු*

10. ඩෙක්මන්වරු
11. රියදුරු (දියේ)
12. යාත්‍රාකරු
13. ගැන්ට්‍රි දොඹකරු සංඥාකරු
14. නිරාවරණ කිමිදුම්කරු
15. නැව් ආම්පන්න හසුරවන්නා
16. සැලසුම් සහකාර (අංගන/නැව් මත)
17. තටාක වැඩකරු
18. බාර ගැනීමේ/බෙදා හැරීමේ නිලධාරී
19. ක්‍රියාකාරී සහායක

*පුහුණු*

20. විංචික්‍රියාකරු
21. කව්ලුතන්දල්
22. නැව් බඩු මෙහෙයවීම් උපකරණ ක්‍රියාකරු
23. සහකාර අංශ අධිකාරී
24. බහලු මෙහෙයුම් උපකරණ ක්‍රියාකරු (QGC/RTG/Fork Lift/Prime Movers/Yard Tractors/Crane/Oil Pumps)
25. ඉංජිනේරු නිලධාරී
26. යන්ත්‍ර කාමර ශිල්පී
27. නාවික කිමිදුම්කරු
28. බහු විධ නිපුණතා බෝට්ටු ක්‍රියාකරු
29. නැංගුරම් පොළ ඕවර්සියර්
30. ප්‍රදීපාගාර භාරකරු
31. සහකාර ක්‍රියාකරු
32. අන්තර් අංගන සම්බන්ධීකාරක
33. ඩෙක්/වාප්පු පාලක
34. අංගන පාලක
35. අංගන සැලසුම්කරු
36. මෙහෙයුම් පාලක
37. කොක්ස්වේන්
38. රියදුරු (ටග් සහ ලෝන්ච්)
39. සහකාර ටග් යාත්‍රාපති
40. බෝසන්
41. කළමනාකරණ සහකාර (මෙහෙයුම්)
42. දියත් පාලක
43. නැව් මෙහෙයුම් පාලක (සැලසුම් ලිපිකරු)
44. මුහුදු යාත්‍රා සම්බන්ධීකරණ නිලධාරී
45. බහුවිධ නිපුණතා ශිල්පී

*සැ.යු.* ඉහතින් දක්වූ සේවක කාණ්ඩ නිරත වූ එක් එක් කාර්යයන්ට ඍජුව, වක්‍රව හෝ අනියම් ආකාරයෙන් සම්බන්ධ වන්නාවූ සේවකයින් ආවරණය වන අතර, එහෙත් කවර හෝ නියෝගයට, විධිවිධානයකට යටත් වන්නා වූ කාර්යාලීය, ඉංජිනේරු හා මෝටර් රථ ප්‍රවාහණ කර්මාන්තයන් හි නිරත සේවක කාණ්ඩ මෙම පඩිපාලක සභා ආවරණයට යටත් නොවන්නේ ය.

10 - 897

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.